අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/9/18/5/1 (II)

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2021.01.

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**"ශිෂෝද්‍යා" විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපන ජාතික ආයතනයයේ ගුරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම.**

විශේෂ අවශ්‍යතා ඇති ළමයින්ගේ අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් හෝමාගම අධ්‍යාපන කලාපයෙහි කහතුඩුව, වෙනිවැල්කොළ පිහිටි "ශිෂෝද්‍යා" විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපන ජාතික ආයතනයෙහි ගුරු තනතුරු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I හා 3-II ශ්‍රේණියේ ගුරුභවතුන් පත්කර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙහිදී විශේෂ අධ්‍යාපන ගුරුවරුන් 04 දෙනෙකු ද, ක්‍රීඩා, උපදේශනය, චිත්‍ර, නැටුම්, සංගීත, තොරතුරු හා පරිගණක තාක්ෂණය විෂයයන්ගෙන් එක් ගුරුභවතෙකු බැගින් ද තෝරා ගැනීම සඳහා පළාත්/ජාතික පාසල්වල දැනටමත් සේවයේ යෙදී සිටින පහත සුදුසුකම් ඇති ගුරුභවතුන්ගෙන් (සිංහල හා දෙමළ මාධ්‍යය) අයදුම්පත් කැඳවනු ලැබේ.

**විශේෂ අධ්‍යාපන ගුරුභවතුන් - 04**

තෝරා ගැනීම සඳහා පහත සුදුසුකම් තිබිය යුතු ය.

a) "ශිෂෝද්‍යා" විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපන ජාතික ආයතනය, විශේෂ අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය සම්බන්ධයෙන් ජාතික ආයතනයක් වන බැවින් ළමයින් තක්සේරු කිරීම, ගුරු උපදෙස් සංග්‍රහ සකස් කිරීම, ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රම හා ඇගයීම් ක්‍රම සංවර්ධනය කිරීම, විශේෂ අධ්‍යාපන ගුරුවරුන් පුහුණු කිරීම වැනි අංශ පිළිබඳව පුහුණුවක් හා පළපුරුද්දක් තිබීම.

b) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින් සඳහා වසර 02කට නොඅඩු කාලයක් ඉගැන්වීමේ පළපුරුද්ද ලබා ඇති අයෙකු වීම.

c) සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් භාෂා දෙකකවත් කටයුතු කිරීමේ හැකියාවක් තිබීම.

**ක්‍රීඩා, උපදේශනය, චිත්‍ර, නැටුම්, සංගීත, තොරතුරු හා පරිගණක තාක්ෂණය විෂයයන් සඳහා ගුරුභවතුන් - 06**

තෝරා ගැනීම සඳහා පහත සුදුසුකම් තිබිය යුතු ය.

a) තමා ඉල්ලුම් කරන විෂය සඳහා රජයේ පාසලක වසර 02කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

b) විශේෂ අධ්‍යාපන ළමයින්ට අදාළ ව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතවීම, අන්තර්කරණය කරන ලද ළමයින්ට අදාළ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතවීම, එම ළමයින්ගේ සුවිශේෂී දක්ෂතා වර්ධනයට ක්‍රියාමාර්ග ගැනීම, පුහුණු කරවීම, තරග විනිශ්චය, ජයග්‍රහණ ආදී කටයුතුවලට සහභාගි වී තිබීම හා ඉන් ජයග්‍රහණ ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

c) සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් භාෂා දෙකකවත් කටයුතු කිරීමේ හැකියාවක් තිබීම.

ඒ අනුව උක්ත තනතුර සඳහා ඔබ පළාතෙහි සේවය කරන ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I හා 3-II ශ්‍රේණියේ ගුරුභවතුන්ගේ අයදුම්පත් මේ සමඟ යොමුකරන ආදර්ශ අයදුම්පත්‍රය පිළිවෙලට සකසා ඔබගේ නිර්දේශය ද සහිත ව "අධ්‍යාපන අධ්‍යක්ෂ, නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, 'ඉසුරුපාය', බත්තරමුල්ල" යන ලිපිනයට වෙත **2021.02.23** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන විෂයය සඳහන් කළ යුතු වේ.

අයදුම්කරු පළාත් සභා පාසලක සේවය කරන්නේ නම් විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය සහිත ව ද, ජාතික පාසලක සේවය කරන්නේ නම් අදාළ අයදුම්පත්‍රය විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය සහිත ව ද ඉදිරිපත් කළ යුතු ය.

**සැ.යු.:-** තෝරා ගන්නා ලද සියලු ම ගුරුභවතුන් ආයතනයේ අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා පැවැත්වෙන නේවාසික, නේවාසික නොවන සහ සුවිශේෂී වැඩසටහන්වලදී සේවා අවශ්‍යතාවය මත සේවයේ යෙදීමට එකඟ විය යුතු ය.

කේ.ඒ.ඩී. පුණ්‍යදාස
අධ්‍යාපන අධ්‍යක්ෂ
(නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන)

අත්/කළේ : මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටපත:-**

1. සියලු ම විශේෂ අධ්‍යාපන විෂයභාර පළාත්/කලාප නි.අ.අ./ස.අ.අ. - කරු.අ.ක.ස.